ලංකා බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති උද්‍යෝගිමත් සහ ඵලදායී ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තාක්ෂණික සහාය පරිපාලක (කොන්ත්‍රාත් පදනම)

1. අධ්‍යාපනික සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක් හා සම්බන්ධ උපාධියක්

හෝ

පිළිගත් ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ එක් (01) වසරක ඩිප්ලෝමාවක්
(ඔබගේ අයදුම්පත සමඟ පිටපතක් අමුණා එවන්න)

2. වෘත්තීය සුදුසුකම්

මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් හා සම්බන්ධ ඕනෑම සහතිකයක් අමතර සුදුසුකමක් වනු ඇත

3. සේවා පලපුරුද්ද

- PC, ඩෙස්ක්ටොප් සහ ATM/CRM දෘඩාංග පිළිබඳ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබිය යුතුය
- ATM/CRM/CDM අභ්‍යන්තර කොටස් පිළිබඳ විශිෂ්ට දැනුම
- පරිඝනක දෘඩාංග ගැටලු විසඳීම සම්බන්ධ පළපුරුද්ද
- ඉලෙක්ට්‍රොනික උපකරණ සහාය පිළිබඳ පළපුරුද්ද
- මෙහෙයුම් පද්ධති, තාක්ෂණික ක්‍රමවේද, සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් පිළිබඳ සේවා දැනුම
- මෙවලම්, කොටස්, සහ බාහිර උපාංග හැසිරවීමේ හැකියාව
- තාක්ෂණික උපදේශ මාලාවන් සහ මෙහෙයුම් මාර්ගෝපදේශයන් වටහා ගැනීමේ හැකියාව

4. වෙනත් සුදුසුකම්

- ශක්තිමත් පාරිභෝගික සේවා නැඹුරුව
- ගැටලු විසඳීමේ විශිෂ්ට හැකියාවන්
- පීඩනය යටතේ ප්‍රමුඛතාව ලබාදෙමින් ඵලදායී ලෙස කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව
- ලිඛිත, වාචික, සහ අන්තර්පුද්ගල සන්නිවේදනයේ ඉහළ කුසලතා
- පර්යේෂණ මත ATM/CRM සහ මෘදුකාංග ආශ්‍රිත ගැටලු විසඳීමේ හැකියාව

5. වයස් සීමාව

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 හෝ ඊට අඩුවිය යුතුය

6. සේවක කාණ්ඩය

- නිශ්චිත කාලසීමා කොන්ත්‍රාත්

7. ගිවිසුම් කාලපරිච්ඡේදය

- සම්පූර්ණ ගිවිසුම් කාලපරිච්ඡේදය වසර 03ක් වනු ඇත (වාර්ෂික ප්‍රගති සමාලෝචනයට යටත්ව)

8. වැටුප් පරිමාණය

- සාකච්ඡා කරගත හැකිය: අයදුම්කරුගේ නිපුණතාව මත ආකර්ෂණීය වැටුප් පැකේජයක් පිරිනැමෙනු ඇත

අයදුම්කිරීමේ පටිපාටිය

- අයදුම්කරුවන් සිය අයදුම්පත්, උපාධි සහතික සහ අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික මෙන්ම අදාළ සෙසු සියලු අධ්‍යාපන සහතිකවල පිටපත් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කරන ලියකියවිලිවල ඡායාපිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් ලිපිකවරයක බහා අදාළ ලිපිකවරයේ වම් ඉහළ කෙළවර අයැදුම් කරන තනතුර සඳහන් කොට පහත ලිපිනයට **2026/11/25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත සඳහන් ඊමේල් ලිපිනය ඔස්සේ යොමුකළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අදාළ ලියකියවිලිවල ඡායා පිටපත් රහිතව ඉදිරිපත් කරනු ලබන හෝ සාවද්‍ය තොරතුරු සපයන ලද සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව බැඳවා ගැනීමේ කාර්ය පාටිපාටියේ ඕනෑම අවස්ථාවක ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී
බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,
18 වන මහල, ලංකා බැංකුව - ප්‍රධාන කාර්යාලය,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන: 011 476 4891
ඊමේල්: career@bocits.lk

BOC IT Solutions (Pvt) Ltd
(A fully owned subsidiary of the Bank of Ceylon)

• කිසියම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම වහාම නුසුදුසුකමක් බවට පත්විය හැකිය. • තෝරාගත් අපේක්ෂකයින් පමණක් කැඳවීමේ අයිතිය සමාගම සතුය.
• පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව හෝ බැඳවා ගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය සමාගම සතුය.